# Script: The contents of Freedom of Religion or Belief – protection from discrimination
# ආගම ඇදහීමට හා විශ්වාසයන් දැරීමට ඇති අයිතියට ඇතුලත් වන දෑ - වෙනස්කොට සැලකීමෙන් ආරක්ෂාවීම

වෙනස් කොට සැලකීමෙන් ආරක්ෂාව වීම සඳහා ඇති අයිතිය, ආගම ඇදහීමට සහ විශ්වාස දැරීමට ඇති අය අයිතිය සමගින් සමීප ලෙස සම්බන්ධ අයිතිවාසිකමක් වනවා.

ආගම හෝ විශ්වාස ඇතුළුව, රාජ්‍යයන් විසින් කිසිදු පදනමක් මත පුද්ගලයන්ට වෙනස් කොට නොසැලකිය යුතුය යන්න ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ ඇති එක්ක ප්‍රධානතම රීතියක් වනවා. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ දෙවැනි වගන්තියේ සහ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ මෙම අයිතිවාසිකම විස්තර කර තිබෙනවා.

**සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ දෙවැනි වගන්තිය, 1 ඡේදය**

*වර්තමාන සම්මුතියට පාර්ශවකරුවකු වන සෑම රාජ්‍යයක්ම තම භූමි ප්‍රදේශය තුළ සිටින සියලුම පුද්ගලයින්ගේ ජාතිය, වර්ණය, ස්ත්‍රීපුරුෂභාවය, භාෂාව, ආගම, දේශපාලන හෝ වෙනත් මතයක්, ජාතික හෝ සමාජ සම්භවය, දේපළ, උපත හෝ වෙනත් තත්වය නොතකා කිසිදු ආකාරයක වෙනසකින් තොරව වර්තමාන ගිවිසුමේ පිළිගත් අයිතිවාසිකම්වලට ගරු කිරීම සහ සහතික කිරීම සිදු කළයුතු වේ.*

ඒ කියන්නේ ආගම හෝ විශ්වාසය පදනම් කරගෙන පුද්ගලයකුට වෙනස් ආකාරයක සැලකීමක් සිදුකිරීම තහනම් කර තිබෙනවා. වෙනස්කොට සැලකීම් මත පනවා ඇති තහනම බලහත්කාරයට ලක් ලක්කිරීම මත පනවා ඇති තහනමට සමානයි. ඒ කියන්නේ රාජ්‍යය තමන්ගේ ක්‍රියා හරහා පුද්ගලයින්ට වෙනස්කොට සැලකීමෙන් වැළැකිය යුතු වන්නා සේම සමාජය තුළ වෙනස්කොට සැලකීම් වැලැක්වීමටත්, නැවැත්වීමටත් ක්‍රියාත්මක වීම ක්‍රියා කිරීම සඳහා රජයට නියම වී තිබෙනවා.

කෙසේ නමුත් සෑම ආගමික සහ විශ්වාස කණ්ඩායමක ම සාමාජිකයින්ට වැඩිපුර ම අත් විඳින්නට සිදුවී ඇති උල්ලංඝනය සහ වැඩිපුරම එල්ල වී ඇති බලපෑම, වෙනස්කොට සැලකීම් විය හැකියි.

ස්වීඩනයෙන් යුදෙව් ආගමිකයකුට රැකියාවක් ලබාදීමට ඇති ඉඩ 26% කින් අඩු බවත් මුස්ලිම් ආගමිකයකුට රැකියාවක් ලබාදීමට ඇති ඉඩ 30% කින් අඩු බවත් පර්යේෂකයින් විසින් සොයාගෙන තිබෙනවා. කුරුසය නැතිනම් හිජාබය වැනි ආගමික සංකේත සේවාස්ථානයේ පැළඳ සිටීම කාර්යයමණ්ඩලයට තහනම් කිරීම සේවායෝජකයා විසින් කළ යුතුද සහ එසේ කිරීම වෙනස්කොට සැලකීමක් වන්නේ කවර අවස්ථාවල ද යන ප්‍රශ්නය ද වැදගත් වනවා. මේ කාරණය යුරෝපීය අධිකරණ සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් හා කමිටුවට අවස්ථා ගණනාවක දී ඉස්මතු කර තිබෙනවා.

වෙනස් කොට සැලකීම විවිධාකාරයෙන් සිදු වන්නට පුළුවනි. ඇතැම් අවස්ථාවල එය සිදුවන්නේ රජය විසින් අනෙකුත් ආගම්වලට වඩා එක් ආගමකට පමණක් අනිසි අනුග්‍රහයක් දැක්වීම තුළින්. රජයේ අරමුදල් විවිධ කණ්ඩායම්වලට වෙන් කිරීමේදී වෙන්ස්කොට සැලකීම මීට උදාහරණයක් වනවා. ඇතැම් අවස්ථාවලදී මෙවැනි වෙනස්කොට සැලකීම් ඉතාමත් බරපතළ වනවා. එවිට පුද්ගලයින්ගේ අයිතිවාසිකම් අහිමි වී යනවා. ඇතැම් පුද්ගල කණ්ඩායම්වලට නෛතික අනන්‍යතාවය සඳහා නැතිනම්

වන්දනාමාන කිරීමට ස්ථාන ඉදි කරගැනීම සඳහා ඇති අයිතිය අහිමි කිරීම උදාහරණ වශයෙන් සලකන්න පුළුවනි. ආගම හෝ විශ්වාසය පදනම් කරගෙනගෙන රජයෙන් සිදුවන වෙනස්කොට සැලකීම් බලපාන්නේ ආගමික ක්‍රියාකාරකම්වලට පමණක් නොවෙයි. එය විවාහය දරුවන්ගේ භාරකාරීත්වය හෝ රැකියා, නිවාස, සුබසාධන සේවා හෝ යුක්තිය කරා ප්‍රවේශ වීම වැනි ජීවිතයේ සෑම පැතිකඩකටම බලපෑමට හැකියි.

බොහෝ රටවල්වල පුද්ගලයින්ගේ හැඳුනුම්පතේ ඔවුන්ගේ ආගම සඳහන් කර තිබෙනවා. මේ හේතුවෙන් තමන්ගේ හැඳුනුම්පත් ඉදිරිපත් කරන සෑම අවස්ථාවකදීම වෙනස්කොට සැලකීමට ලක් වීමේ අවදානමට සුළුතර කණ්ඩායම් මුහුණ දෙනවා.

ඉන්දුනීසියාවේ ඇතැම් ප්‍රදේශවල වාසය කරන හින්දු භක්තිකයින්ට තමන්ගේ විවාහ හෝ උපත් ලියාපදිංචි කිරීම් සඳහා බොහෝ දුර ස්ථාන කරා ගමන් කිරීමට සිදුව ඇත්තේ ඔවුන්ගේ ප්‍රදේශවල නිලධාරීන් ඒවා ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරන නිසාවෙන්. ඒ වගේම දේවස්ථාන ඉදිකිරීම හෝ අලුත්වැඩියා කිරීමේදී ඒ සඳහා අවසර ගැනීම සම්බන්ධයෙන් ක්‍රිස්තියානි භක්තිකයින් ප්‍රශ්නවලට මුහුණ දෙනවා. රටේ ජාතික අධිකරණයෙන් ක්‍රිස්තියානි භක්තිකයින්ට වාසිසහගත වන අන්දමෙන් නැවත නැවතත් තීන්දු ලබා දී ඇතත් ප්‍රචණ්ඩ අන්තවාදී කණ්ඩායම්වලට ඇති බිය හේතුවෙන් ප්‍රාදේශීය නිල්ධාරීන් මෙම තීන්දු නොසලකා හරිනවා.

පාකිස්ථානයේ පවතින වෙනස්කොට සලකන්නා වූ නීති හේතුවෙන් අහමදියාවරුන්ට තමන්ගේ ආගම දේශනා කිරීම, ප්‍රචාරය කිරීම හෝ ආගමික ලිපිලේඛන බෙදා හැරීම අපරාධ වරදක් වන අතර ඔවුන්ට ඡන්දය ලබා දීමේ අයිතිය ද අහිමි කර තිබෙනවා.

කෙන්යාවේ ත්‍රස්තවාදයට එරෙහිව සිදුවන සටනේ ප්‍රතිඵලයක් වශයෙන් ආරක්ෂක නිලධාරීන් විසින් මුස්ලිම් භක්තිකයින් සාමුහිකව ඉලක්ක කිරීම සහ ඔවුන්ට දඬුවම් පැමිණවීම පුළුල්ව ව්‍යාප්ත වී ඇති බව මානව හිමිකම් සංවිධාන පවසනවා. විශේෂයෙන්ම අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, වදහිංසා පැමිණවීම, මරා දැමීම හා අතුරුදන් කරවීම සිදු වන බවට වාර්තා වන නමුත් රජය මෙම චෝදනා ප්‍රතික්ෂේප කරනවා.

මියන්මාරයේ ගම්මාන 22 ක බෞද්ධ භික්ෂූන් එම ප්‍රදේශය මුස්ලිම්වරුන්ගෙන් තොර කලාපයක් වශයෙන් ප්‍රකාශයට පත්කර එම ගම්මානවලට ඇතුළුවීම හෝ එහි රාත්‍රිය ගතකිරීම මුස්ලිම්වරුන්ට තහනම් කරන, ගම්වාසීන්ට මුස්ලිම්වරුන් සමගින් විවාහවීම තහනම් කරන, සහ වෛරී අදහස් පතුරුවන නිවේදන පුවරු පළකර තිබෙනවා. මෙය නැවැත්වීමට බලධාරීන් විසින් කිසිවක් කර නැහැ.

බොහෝ අවස්ථාවලදී පුද්ගලයින්ට විරුද්ධව වෙනස්කොට සලකන්නේ එකකට වඩා වැඩි හේතු සංඛ්‍යාවක් මතයි. උදාහරණ වශයෙන්, ආගම මෙන්ම ජනවර්ගය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, හෝ පන්තිය පදනම් කරගෙන පුද්ගලයින්ට වෙනස්කොට සලකන්නට ඉඩ තිබෙනවා. මානව හිමිකම් සම්බන්ධයෙන් කතා කිරීමේදී මෙය හඳුන්වන්නේ අන්තර්ඡේදනය වන වෙනස්කොට සැලකීම් වශයෙනුයි. මේ හේතුවෙන් කාන්තාවන්, ස්වදේශික ජනතාව, ජනවාර්ගික සුලුතර, එල්ජීබීටී ප්‍රජාව, සංක්‍රමණිකයින්, සහ සරණාගතයින් වැනි ඇතැම් කණ්ඩායම් ආගම ඇදහීමේ හෝ විශ්වාස දැරීමේ අයිතිවාසිකම් උල්ලංඝනයට වඩාත් වැඩි අවදානම් පාත්‍රතාවයක් දක්වනවා.

අන්තර්ඡේදනයවන වෙනස්කොට සැලකීම් සඳහා අපි ඉන්දියාවෙන් උදාහරණයක් ගෙන බලමු.

හින්දු කුල ක්‍රමය කියන්නේ ඉහළ සහ පහළ කුලවලවලට පුද්ගලයින් බෙදා වෙන් කරන ස්ථිර පන්ති පද්ධතියකටයි. දාලිත් වැනි කුල පහළ කුල වශයෙන් සලකනවා. බොහෝවිට මෙම දාලිත්වරුන් අතිශයින්ම දුගී, ඉතාමත් බරපතළ සමාජ සහ ආර්ථික වෙනස්කොට සැලකීම්වලට මුහුණ දෙන ජන කොටසක්. මෙම කුල ක්‍රමය හින්දු ආගමෙන් පැන නගින්නක් වුවත් එය සමස්ත ඉන්දියානු සමාජය තුලම කිඳා බැස ඇති අතර සියලුම ආගම්වලට අයත් පුද්ගලයින් තමන් යම් යම් කුලවලට අයත් බව

සලකනවා. උදාහරණයක් වශයෙන් බොහෝ ඉන්දියානු ක්‍රිස්තියානි භක්තිකයන් සහ මුස්ලිම්වරුන් දාලිත් සම්භවයක් සහිත පුද්ගලයින් වනවා.

ඉන්දියාවට නිදහස ලැබුණු පසු රජය කුල ක්‍රමය තහනම් කර, කුලය පදනම් කරගෙන සිදුවන වෙනස්කොට සැලකීම් වැළැක්වීම සඳහා ප්‍රතිජානන ක්‍රියාමාර්ග ක්‍රමවේදයක් හඳුන්වාදෙනු ලැබුවා. මේ ක්‍රමවේදය යටතේ රජයේ රැකියාවලින් යම් කෝටාවක් සහ රජයේ උසස් අධ්‍යාපන ආයතනවල යම්කිසි ස්ථාන සංඛ්‍යාවක් දාලිත්වරුන්ට හිමිකරදීමට සහ ඔවුන්ට යම් යම් සුභසාධන ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කර තිබෙනවා. කෙනෙකුට මෙය හොඳ දෙයක් කියා සිතෙන්නට පුළුවනි. කෙසේ නමුත් මේ ප්‍රතිලාභ ලැබෙන්නේ හින්දු දාලිත්වරුන්ට සහ දාලිත් සම්භවයක් සහිත සීක් ආගමිකයින්ට සහ බෞද්ධාගමිකයන්ට පමණයි. දාලිත් සම්භවයක් සහිත ක්‍රිස්තියානි සහ මුස්ලිම්වරුන්ට මේ ප්‍රතිලාභ හිමිවන්නේ නැහැ.

ඔවුන්ගේ කුලය හේතුවෙන් මෙන්ම සුළුතර ආගමකට අයත්වීම හේතුවෙන් ක්‍රිස්තියානි සහ මුස්ලිම් දාලිත්වරුන් ප්‍රජාව තුළ වෙනස්කොට සැලකීමට ලක් වනවා. ඒ වාගේම, ඔවුන්ගේ ආගම පදනම් කරගෙන රජය විසින් ද ඔවුන් වෙනස්කොට සැලකීමට ලක් කරනවා. මෙය ක්‍රිස්තියානි සහ මුස්ලිම් දාලිත්වරුන්ගේ ආර්ථික හා සමාජ සංවර්ධනය මත බලපෑම් එල්ල කරනවා.

සාරාංශයක් ලෙස කියනවානම්, ආගම හෝ විශ්වාසය මත පදනම්ව පුද්ගලයින්ට වෙනස්කොට සැලකීම සඳහා රාජ්‍යයන්ට අවසර නැහැ. ඒ වාගේම සමාජය තුළ වෙනස්කොට සැලකීම වැළැක්වීමට සහ නැවැත්වීමට කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මකවීම තුළින් ජනතාව ආරක්ෂා කිරීම සඳහා ඔවුන්ට වගකීමක් තිබෙනවා.

වෙනස්කොට සැලකීම් විවිධ ස්වරූපවලින් සිදුවිය හැකි අතර එය ජීවිතයේ සෑම පැතිකඩකට ම බලපානවා. බොහෝ අවස්ථාවල, ආගම සහ විශ්වාස ද ඇතුළුව බහුවිධවූත් අන්තර්ඡේදනය වන්නා වූත් හේතු මත පුද්ගලයින් වෙනස් කොට සැලකීමට ලක් වනවා.

මේ සම්බන්ධයෙන් සඳහන් වන මානව හිමිකම් ලේඛන ද ඇතුළුව, වෙනස්කොට සැලකීමෙන් ආරක්ෂාවීම සම්බන්ධයෙන් වැඩි විස්තර, වෙබ් අඩවියේ ඇති පුහුණු ද්‍රව්‍ය වලින් ඔබට සොයාගත හැකි වේවි.

Copyright: SMC 2018